43188

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 11 - ශ්‍රේණිය

## ඉතිහාසය - I

කාලය: පැය 01යි.

* සැලකිය යුතුයි.

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 01 - 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ දී ඇති අනෙක් උපදෙස් ද කියවා පිළිපදින්න.

---

(01) විවිධ පුද්ගලයන් ඉතිහාසය විෂය පිළිබඳ විවිධාකාරයෙන් අර්ථ දක්වා ඇත.
"ඊ. එච්. කාර් මහතා ඉතිහාසය විෂයය අර්ථ දැක්වූයේ කුමන ආකාරයෙන් ද?
- (1) ඉතිහාසය එක් විෂයයක් නොව විෂයයන් සියල්ල අන්තර්ගත ගාහය ලෙසයි.
- (2) වර්තමානය හා අනාගතය අතීතයෙන් ගොඩනැගෙන අතර එය අමතක කිරීම අත්තිවාරමක් නොමැතිව කරන ඉදිකිරීමක් වැනි ය.
- (3) වර්තමානය තේරුම් ගැනීමට යතුර වශයෙන් අතීතය තේරුම් ගත යුතු ය.
- (4) ඉතිහාසය යනු මානව සමාජ විකාශනයේ කථාන්තරයයි.

(02) ලංකා ඉතිහාසය හැදෑරීමේ දී ප්‍රබල ඓතිහාසික මූලාශ්‍ර ලෙස ඔබ විසින් යෝජනා කරනු ලබන්නේ,
- (1) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර හා වංශ කථා ය.
- (2) විදේශීය වාර්තා හා අට්ඨකථා ය.
- (3) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර හා විදේශීය වාර්තා ය.
- (4) පද්‍ය සාහිත්‍ය මූලාශ්‍ර හා පුරා විද්‍යාත්මක මූලාශ්‍රය

(03) ලංකාවට බුදු දහම රැගෙන ඒම පිළිබඳව විස්තර අඩංගු විනය පිටකයට ලියන ලද අට්ඨ කථාව කුමක් ද?
- (1) රාජ රත්නාකරය
- (2) සමන්ත පාසාදිකාව
- (3) දම්පිය අටුවා ගැටපදය
- (4) සම්මෝහ විනෝදනිය

(04) පහත සඳහන් වාක්‍යවලින් සදොස් වන්නේ කුමක්දැයි තෝරන්න.
- (1) ප්‍රාග් ඓතිහාසික යුගය යනු ලිඛිත ඉතිහාසය ආරම්භ වීමට පෙර අවධියයි.
- (2) කුරුවිට ආසන්නයේ පිහිටියේ අත්තනගොඩ ලෙනයි.
- (3) වලාහස්ස ජාතකයේ ලංකාවට සංක්‍රමණිකයන් පැමිණි බවට තොරතුරු ඇත.
- (4) බලංගොඩ මානවයා ඉත්තෑවන්, ලේනුන්, වඳුරන් ආහාරයට ගෙන ඇත.

(05) පහත දැක්වෙන්නේ ලංකාවට සිදු වූ දකුණු ඉන්දියානු ආක්‍රමණයන් හා ඒවාට මුහුණ දුන් රජවරුන් ය. එම ආක්‍රමණික කණ්ඩායම් හා රජවරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| රජවරු | ආක්‍රමණික කණ්ඩායම |
|---|---|
| 1. වළගම්බා රජු | A. පණ්ඩු හා පාරින්ද ඇතුළු පිරිස |
| 2. මිත්සෙන් රජු | B. දෙවන පරන්තක |
| 3. පස්වන මිහිඳු රජු | C. I රාජේන්ද්‍ර |
| 4. සූරතිස්ස රජු | D. පුලහත්ථ ඇතුළු පිරිස |
| | E. සේන හා ගුත්තික |

(1) DEAC (2) DAEC (3) ADCE (4) DACE

(06) ලංකා ඉතිහාසයේ දුටුගැමුණු රාජ්‍ය සමයේ ලක්දිවට පැමිණි විදේශීය සංචාරකයෙකුට අසන්නට හොලැබෙන සිදුවීම තෝරන්න.

(1) මාතලේ අළුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(2) නගර සීමා ලකුණු කර අනුරාධපුර නගරය ක්‍රමවත් බවට පත්කිරීම
(3) සද්ධාතිස්ස රජු දීගාමඩුල්ලේ කෘෂිකාර්මික කටයුතුවල යෙදී රටට ආහාර සැපයීම
(4) සංඝමිත්තා තෙරණියගේ ආගමනයත් සමඟ ශ්‍රී මහා බෝධින් වහන්සේ ලංකාවට ලැබීම

(07) පහත සඳහන් වාක්‍ය කාණ්ඩය කියවන්න. 'දුර බැහැර පළාත්වල විසූ ජනතාව සමඟ සබඳතා ගොඩනගා ගැනීමට මෙම රජු උත්සාහ දරා ඇත.
මෙම තොරතුරු හා වඩාත් සම්බන්ධ රජු තෝරන්න.

(1) පළමුවන විජයබාහු රජු (2) පළමුවන පරාක්‍රමබාහු රජු
(3) නිශ්ශංකමල්ල රජු (4) දෙවන පරාක්‍රමබාහු රජු

(08) පැරණි ලක්දිව ගල්කැටයම් කරුවෝ මහා කළුගල් බුදු පිළිම බවට පත් කළහ. එසේ පත්කළ බුදු පිළිම අතරින් දස බලධාරී ගුණය නිරූපණය වන පිළිමය කුමක් ද?

(1) සමාධි බුදු පිළිමය (2) තොලුවිල බුදු පිළිමය
(3) අවුකන බුදු පිළිමය (4) මාළිගාවිල බුදු පිළිමය

(09) පහත සඳහන් වාක්‍ය අතරින් නොගැළපෙන වාක්‍ය තෝරන්න.

(1) ගංගාවක් හෝ ඔයක් හරස් කර වැවක් නිර්මාණය කරයි.
(2) තම්බෝව වැවට මී ඔයෙන් ජලය ලබාගනියි.
(3) නුවර වැව, කලා වැව, පදවි වැව යන වැව්වල පෝෂක ප්‍රදේශය 'නුවරකලාවිය' නමින් හඳුන්වයි.
(4) පිටවාන යනු වැවේ මඩත් සමඟ ජලය පිටකිරීමට සාදා ඇති දොරටුවකි.

(10) අනුරාධපුර යුගයේ කාන්තාවන්ට වැදගත් තැනක් හිමිවිය. එයට බලපෑ සාධකය පහත ප්‍රකාශන අතරින් තෝරන්න.

(1) අධ්‍යාපනය අතින් කාන්තාවන් සමාජයේ ඉහළ තත්ත්වයක සිටීමයි.
(2) කාන්තාවන්ට දේශපාලන නායකත්වය හිමිවීමයි.
(3) බුදු දහම තුළින් ලත් ශික්ෂණය නිසා කාන්තාවන්ට ඉහළ පිළිගැනීමක් ලැබීමයි.
(4) ඉඩකඩම් හිමිකම් නීතිය අනුව පවුලේ ඉඩම් අයිතිය කාන්තාවන්ට ලැබීමයි.

(11) වාරි කර්මාන්තයට මහසෙන් රජතුමාගෙන් ඉටු වූ සේවය ප්‍රශංසනීයයි. මේ නිසාම මහසෙන් රජු හැඳින්වීමට ගෞරවනීය අනවර්ථ නාමයක් භාවිත කරන ලදී. එය,

(1) කළු බණ්ඩාර දෙවියෝ ය. (2) මින්නේරි දෙවියෝ ය. (3) මිනිපේ දෙවියෝ ය. (4) සමන් දෙවියෝ ය.

(12) "වටදා ගෙය" යනුවෙන් හඳුන්වන්නේ,

(1) චෛත්‍යයක ආරක්ෂාවට සකස් කර ඇති ගෘහයකි. (2) චෛත්‍යයක අලංකාරයට ඉදිකර ඇති නිර්මාණයකි.
(3) චෛත්‍යයේ ධාතුන් නිදන් කොට ඇති කොටසකි. (4) චෛත්‍යයක ගෝලාකාර ගර්භය ඉදිකර ඇති පාදමයි.

(13) ලංකාවේ ගෘහ නිර්මාණ විවිධ රටවල ආභාසයෙන් නිර්මාණය වී ඇති බව ප්‍රකට කරුණකි. ඒ අතුරින් යාපහුව රාජධානි සමයේ ගෘහ නිර්මාණ සඳහා වැඩි වශයෙන් ආභාසය ලැබී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?

(1) ඉතාලියෙන් ය. (2) මෝගල් අධිරාජ්‍යයෙන් ය.
(3) දකුණු ඉන්දියාවෙන් ය. (4) ගිනිකොන දිග ආසියාතික රටවලින් ය.

(14) A චන්ද්‍රභානුගේ ආක්‍රමණවලට මුහුණ දීම

B රජවීමට ප්‍රථම යාපනයේ පාලකයා වීම

C මාඝගෙන් රට මුදා ගැනීම

D සිංහල සංඝයා නම් කැරැල්ලට මුහුණ දීම

E අටවන වීර පරාක්‍රමබාහු නමින් රජවීම

ඉහත තොරතුරු වලින් හයවන බුවනෙකබාහු රජුට පමණක් අදාල වන සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) AE (2) AC (3) BE (4) BD

(15) යාපනය රාජ්‍ය හා සම්බන්ධ සිදුවීම් කිපයක් හා එම තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර කිපයක් පහත 'අ' හා 'ආ' තීරු දෙකෙහි දැක්වේ. එම තීරු දෙක නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| (අ) | (ආ) |
|---|---|
| 1. ආර්ය චක්‍රවර්ති රජවරු දොළොස් දෙනෙකු යාපනය පාලනය කිරීම | A ආලම්පූර් සන්නස |
| 2. වසභ රජුගේ පාලනය උතුරු ප්‍රදේශයේ පැතිර තිබීම | B නිකාය සංග්‍රහය |
| 3. විජය නගර් අධිරාජ්‍යය උතුරු ප්‍රදේශය ආක්‍රමණය කිරීම | C අස්ගිරි තල්පත |
| 4. ගම්පොළ රාජධානි සමයේ ආර්ය චක්‍රවර්ති දකුණට ආක්‍රමණ එල්ල කිරීම | D යාල්පානම් වෛපවමාලෙයි |
| | E වල්ලිපුරම් රන් සන්නස |

(1) DEAB (2) BCDA (3) DEBA (4) ADCE

(16) ක්‍රි.ව. 1815 දී ඉංග්‍රීසින්ට උඩරට ජයගැනීමට උපකාර් වූ ප්‍රධානතම සාධකය වූයේ,

(1) කතෝලික ධර්මය පැතිරවීමට රජයේ අනුග්‍රහය ලැබීම

(2) උඩරට රදළයින්ගේ ආධාර ලබාගැනීම

(3) රජු, රදළ ප්‍රධානීන් සහ ජනතාව අතර තිබූ සහයෝගය බිඳීයාම

(4) දේශීය ජනතාව ඉංග්‍රීසින්ට උදව් කිරීම

(17) (I) ක්‍රි.ව. 1910 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ දී උගත් ලාංකිකයින් වෙනුවෙන් ව්‍යවස්ථාදායක සභාවට තේරී පත්වීම

(II) ක්‍රි.ව. 1915 දී සිංහල මුස්ලිම් කෝලාහලය සමයේ දී නඩු විභාගයකින් තොරව සිරභාරයට ගත් සිංහල ජනනායකයින් නිදහස් කරගැනීමට කැපවීමෙන් ක්‍රියාකිරීම

ඉහත දක්වා ඇති කරුණු හා සම්බන්ධ කටයුතු කළ ද්‍රවිඩ ජාතික නායකයා වූයේ,

(1) ශ්‍රීමත් පොන්නම්බලම් අරුණාචලම් මහතා (2) ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් මහතා

(3) සෞම්‍ය මූර්ති තොණ්ඩමන් මහතා (4) එස්. ජේ. වී. චෙල්වනායගම් මහතා

(18) ක්‍රි.ව. 1919 දී ලාංකික මධ්‍යම පංතික නායකයින් විසින් ගෙනයන ලද දේශපාලන උද්ඝෝෂණ ව්‍යාපාරයේ වැදගත් ම ප්‍රතිඵලය ලෙස දැක්විය හැක්කේ,

(1) ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීම ය. (2) ලංකා ජාතික සංගමය පිහිටුවීම ය.

(3) තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම ය. (4) අමද්‍යප ව්‍යාපාරය පිහිටුවීම ය.

(19) දේශීය කෘෂි කර්මාන්තය නගා සිටුවීම සඳහා ක්‍රි.ව. 1900 දී වාරිමාර්ග දෙපාර්තමේන්තු පිහිටුවීමට දායක වූ ආණ්ඩුකාරවරයා වන්නේ,

(1) රොබට් බ්‍රවුන්රිග් ය. (2) තෝමස් මෙට්ලන්ඩ් ය. (3) වෙස්ට් රිජ්වේ ය. (4) ෆ්‍රෙඩ්රික් නෝර්ත් ය.

(20) ක්‍රිස්තු වර්ෂ 1815 මාර්තු 02 වන දින උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසින් විසින් ඔසවන ලද බ්‍රිතාන්‍ය කොඩිය බිම හෙළා යළි සිංහ කොඩිය එසවූ භික්ෂූන් වහන්සේ වූයේ,

(1) වාරියපොළ ශ්‍රී සුමංගල හිමි ය. (2) කුඩාපොළ හිමි ය.
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය. (4) වැලිවිට ශ්‍රී සරණංකර හිමි ය.

(21) ශ්‍රී ලංකාවේ ජනතාව ව්‍යවස්ථා සම්පාදනයට සම්බන්ධ වන අවස්ථාවක් වන්නේ,

(1) මහමැතිවරණයයි. (2) ජනමත විචාරණයයි.
(3) ජනාධිපතිවරණයයි. (4) පළාත් සභා මැතිවරණයයි.

(22) පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශයන් දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.

A 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කැබිනට් මණ්ඩලයේ සංයුතිය තීරණය කරන්නේ අගමැතිතුමා ය.
B අමාත්‍ය මණ්ඩලය සාමූහිකව පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටියි.
C පාර්ලිමේන්තු පනත් නීතියක් බවට පත්වන්නේ ජනාධිපතිතුමා අත්සන් කිරීමෙනි.
D ශ්‍රී ලංකාවේ අවසාන අභියාචනාධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණයයි.

(1) B, D (2) C, B (3) A, C (4) C, A

(23) මහමත්තුමා මියගොස් වසර 10ක් පමණ වන විට ප්‍රදේශ ගණනාවක් නතු කරගැනීමට ඉස්ලාම් ධර්මය සමත් විය. එම ප්‍රදේශවලට අයත් නොවන රට කුමක් ද?

(1) සිරියාව (2) ඇෆ්ගනිස්ථානය (3) මිසරය (4) ඉරාකය

(24) ඇෆ්ගන් පරපුරේ ශ්‍රේෂ්ඨතමයා වීම
ඉන්දියාවට පොදු ආගමක් හඳුන්වාදීමට උත්සාහ ගැනීම
තමා ඇලෙක්සැන්ඩර්ගේ ප්‍රතිමූර්තිය සේ සැලකීම
මලික් කපූර් නැමැති දක්ෂ සෙන්පතියෙක් සේනාව භාරව සිටීම
ඉහත තොරතුරුවලින් කියවෙන දිල්ලි සුල්තාන් පාලකයා කවුරුන් ද?

(1) මොහොමඩ් බින් ටුග්ලුග් (2) කුටුබ්දීන් අයිබෙක්
(3) අලා උද්දීන් ඛල්ජි (4) බක්තියර් ඛල්ජි

(25) ඉන්දියාවේ පැවති ප්‍රාදේශීය රාජ්‍යයන් කිපයක් පහතින් දක්වා ඇත. ඒවායින් හින්දු හා මුස්ලිම් රාජ්‍යයන් දෙකක් දක්වෙන පිළිතුර කුමක් ද?

(1) බහමනි - අහමද්නගර් (2) බිජාපූර් - ගොල් කොන්ඩා
(3) මාල්වා - බිදාර් (4) වරංගල් - බෙංගාල

(26) යුරෝපයේ වැඩවසම් ක්‍රමය ආරම්භයත් සමඟ වංශාධිපතිරුන්ට රජු විසින් පවරන ලද බලතල හා කාර්යන් පහත දක්වේ. ඒවායින් සාවද්‍ය පිළිතුර තෝරන්න.

(1) රජුගේ ආදායම් මාර්ගය වූ ඉඩම් පවරා දීම. (2) වැසියන් සම්බන්ධ අධිකරණ බලතල පවරා දීම
(3) රට වැසියන් ආරක්ෂා කිරීම පවරාදීම (4) බාහිර රටවල් සමඟ සිදු වූ වෙළඳාම පවරාදීම

(27) යුරෝපයේ සිදු වූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරවල ප්‍රතිඵලයක් දක්වෙන පිළිතුර කුමක් ද?

(1) රටවල් ඇදාගනිමින් යටත් විජිත බිහිකිරීම
(2) ශුද්ධ රෝම අධිරාජ්‍යයේ බලය දුර්වල වීම
(3) කිතුණු සභාව ලෞකිකත්වයට බර වීම
(4) රජවරුන්ගේ බලයට වඩා පූජකවරුන්ගේ බලය ඉහළයාම

(28) යුරෝපයේ පුනරුදය ඇතිවීම කෙරෙහි බලපෑ ආසන්නම හේතුව කුමක් ද?
(1) යුරෝපයේ වෙළඳාම වර්ධනය වීම
(2) පස්වන නිකලස් පාප්වරයා වතිකානුවේ පුස්තකාල සකස් කිරීමට අනුග්‍රහය දැක්වීම
(3) ඔටෝමන් තුර්කිවරු නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර අල්ලා ගැනීම
(4) ධනවත් පවුල් කලා කටයුතුවලට අනුග්‍රහය දැක්වීම

(29) පහතින් දක්වා ඇත්තේ කාර්මික විප්ලවයේ නව සොයාගැනීම් හා ඊට සම්බන්ධ පුද්ගලයින් ය. ඒ අනුව X හා Y තීරු ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| X | Y |
|---|---|
| 1. ජොහැන්නස් ගුටන් බර්ග් | A. සෞරග්‍රහ මණ්ඩලය |
| 2. නිකලස් කොපර්නිකස් | B. චිත්‍ර ශිල්පය |
| 3. විලියම් හාවේ | C. වෛද්‍ය විද්‍යාව |
| 4. වස්කෝ ද ගාමා | D. මුද්‍රණ යන්ත්‍රය |
| | E. දේශ ගවේෂණය |

(1) DEBA (2) DACE (3) EABC (4) DCBE

(30) ප්‍රංශ විප්ලවයට බලපෑ මානවවාදී අදහස් ඉදිරිපත් කළ දාර්ශනිකයන් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ඇරිස්ටෝටල්, හිපොක්‍රටීස්, වෝල්ටෙයාර්
(2) මොන්ටෙස්කියු, වෝල්ටෙයාර්, රූසෝ
(3) වෝල්ටෙයාර්, බොකෑෂියෝ, හෙරඩෝටස්
(4) ඩාන්ටේ, පෙට්‍රාක්, බොකෑෂියෝ

(31) ඔස්ට්‍රියාවේ චාන්සලර්වරයා වූ මෙටර්නික් කාල්ස්බාඩ් ආඥාව මගින් සිදුකළේ,
(1) සමාජවාදී අදහස් මර්ධනය කිරීම ය.
(2) තීරු බදු ප්‍රති සංවිධානය කිරීම ය.
(3) ලිබරල්වාදී අදහස් මතුවීම වැළැක්වීම ය.
(4) ජර්මනිය එක්සත් කිරීම ය.

(32) ක්‍රි.ව. 1857 දී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඉන්දියානුවන්ගෙන් එල්ල වූ කැරැල්ලෙහි වැදගත් ම ප්‍රතිඵලය වූයේ,
(1) බ්‍රිතාන්‍ය උපක්‍රමශීලී ක්‍රියාමාර්ග මගින් කැරැල්ල මර්ධනය කිරීමයි.
(2) වෙළඳ සමාගමේ පාලනය අවසන් කොට ඉන්දියාව බ්‍රිතාන්‍ය කිරීටය යටතට පත්කිරීමයි.
(3) ඉන්දියානු ජනතාව තුළ දේශාභිමානී හැඟීම් වර්ධනය වීමයි.
(4) ඉන්දියානු ජනතාවගේ අවශ්‍යතා බ්‍රිතාන්‍ය පාලකයින් වටහාගැනීමයි.

(33) බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව මහත්මා ගාන්ධිතුමා ක්‍රියාත්මක කළ සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය ආරම්භ වන්නේ,
(1) සබරමතී ආශ්‍රමයේ සිට දණ්ඩි වෙරළ දක්වා ගිය පා ගමනෙනි.
(2) කම්කරු පොරොන්දු පත්‍ර අවලංගු කිරීම සඳහා ගෙනගිය සත්‍ය ග්‍රහ ව්‍යාපාරයෙනි.
(3) බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත භාණ්ඩ වර්ජනය කිරීමෙනි.
(4) බ්‍රිතාන්‍යයන් එලවා දැමීම සඳහා ඉන්දියාවෙන් ඉවත්වෙනු ව්‍යාපාරය ආරම්භ කිරීමෙනි.

(34)
- ජාතික කොංග්‍රසයෙන් ඉවත් වී ප්‍රගතිශීලී පිළ ගොඩනැගීම
- බුරුමයට හා මලයාවට ගොස් බ්‍රිතාන්‍යයන්ට එරෙහි සේනා සංවිධානය කිරීම
- ගුවන් අනතුරකින් මියයාම

ඉහත විස්තරවලින් කියවෙන ඉන්දියානු නිදහස් සටනට සම්බන්ධ පුද්ගලයා කවුරුන් ද?
(1) දදාභායි නඖරෝජි
(2) සුරේන්ද්‍රනාත් බැනර්ජි
(3) බිපින් චන්ද්‍රපෝල්
(4) සුභාෂ් චන්ද්‍රබෝස්

(35) 17 වන සියවසේ මුල් භාගයේ සිට ෂෝගුන්වරුන් විසින් පවත්වාගෙන ගිය ජපානයේ හුදකලා ප්‍රතිපත්තිය බිඳ වැටෙන්නේ,

(1) කොමදෝරු පියර්ගේ දුම් නැව ටෝකියෝ බොක්කට ඇතුල්වීමෙනි.

(2) ක්‍රි.ව. 1858 හැරිස් ටවුන්සෙන්ඩ් ෂෝගුවරුන් සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීමත් සමඟ ය.

(3) ෂෝගුන්වරු පාලනය අතහැරීමත් සමඟ ය.

(4) අධිරාජ්‍යවරයා විසින් වැඩවසම් ක්‍රමය අහෝසි කිරීමත් සමඟ ය.

(36) ක්‍රි.ව. 1959 මාඕ සේතුංගේ නායකත්වය යටතේ චීනයට හඳුන්වාදුන් 'මහා ඉදිරිපිම්ම' නම් වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වූයේ,

(1) කර්මාන්ත ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනයක් ඇති කිරමයි.

(2) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සීඝ්‍ර වර්ධනයක් ඇති කිරීමයි.

(3) නිර්ධන පංතියේ සංස්කෘතික විප්ලවයක් ඇති කිරීමයි.

(4) විදේශ රටවල් සමඟ රාජතාන්ත්‍රික සම්බන්ධතා වර්ධනය කරගැනීමයි.

(37) පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු යුරෝපයේ පැවති ඒකාධිපති රාජාණ්ඩුව බිඳ වැටී නව රාජ්‍ය ගණනාවක් බිහිවිය. එසේ බිහිවූ රාජ්‍ය දෙකක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) පින්ලන්තය - රුමේනියාව　(2) ඉරාකය - ඉස්තාන්බුල්

(3) ජර්මනිය - පෝලන්තය　(4) තුර්කිය - ඔස්ට්‍රියාව

(38) මානව හිමිකම් ආරක්ෂා කිරීමට වත්මන් ලෝක ප්‍රජාව යොමු වී ඇත්තේ,

(1) සමාජවාදී අදහස් ලෝකයේ පැතිරීමත් සමඟ ය.

(2) මානවවාදය ලෝකයේ ව්‍යාප්ත වීමත් සමඟ ය.

(3) ලිබරල්වාදය එළිදැක්වීමත් සමඟ ය.

(4) මානවවාදී උගතුන්ගේ දේශ සංචාරයත් සමඟ ය.

(39) රුසියන් ආර්ථිකයේ දියුණුවට කෘෂි අංශයෙන් ප්‍රබල දායකත්වයක් ලැබීමට හේතු වූයේ,

(1) සාමූහික ගොවිපල වැඩසටහනයි.　(2) කාර්මික අංශයේ නව දියුණුවයි.

(3) රසායනික පොහොර වැඩිපුර යෙදීමයි.　(4) ශෂ්‍ය මාරු ක්‍රමයයි.

(40) දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් වූ යුරෝපා රටවල් හා ජපානය නැවත ගොඩනැංවීමට විශාල වශයෙන් උදව් වූ සංවිධානය වන්නේ,

(1) නේටෝ සංවිධානය　(2) සියැටෝ සංවිධානය

(3) මාර්ෂල් සැලැස්ම　(4) වෝර්සෝ සැලැස්මයි.

43172

Extra

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 11- ශ්‍රේණිය

## ඉතිහාසය - II

කාලය: පැය 03යි.

I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
II කොටසින් ප්‍රශ්න තුනකට ද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.

### I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) මැණික් ගඟ, පරාක්‍රම සමුද්‍රය, දේවනගර, නාගදීපය, අනුරාධ ග්‍රාම, මහියංගනය, කෝට්ටේ, මහාතිත්ථ, දීඝවාපිය, ජජ්ජර නදී. (ලකුණු 10)

(ii) හොවැංහෝ ගඟ, සුවස් ඇළ, බතාවිය, මැගලන් සමුද්‍ර සන්ධිය, හේග් නගරය, හවායි දූපත්, මක්කම, මධ්‍යධරණී මුහුද. (ලකුණු 08)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. පළමුවන සේන රජු සමයේ පාණ්ඩ්‍ය දේශයේ සිට පැමිණ ලංකාව ආක්‍රමණය කොට වස්තුව කොල්ලකෑම.
B. ක්‍රි. ව. 1899 "විවෘත ද්වාර ප්‍රතිපත්තිය" නම් යෝජනාවලිය ඉදිරිපත් කිරීම.
C. ක්‍රි.ව. 1803 බ්‍රිතාන්‍ය සෙන්පතියෙකු වශයෙන් උඩරට ආක්‍රමණය කිරීම.
D. ජපානයේ ප්‍රථම දේශපාලන පක්ෂය වන ලිබරල් පක්ෂය පිහිටුවීමේ පුරෝගාමියා වීම. (ලකුණු 04)

(ii) A හා B පින්තූර හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ම ලියන්න.



A

1. A රූපයෙන් දැක්වෙන ගොඩනැගිල්ල කුමක් ද?
2. මෙම ගොඩනැගිල්ල අයත් වන්නේ කුමන රාජධානි සමයට ද?
3. එම රාජධානිය ආරම්භ වන්නේ කුමන වර්ෂයේ ද?
4. සාහිත්‍ය උන්නතිය හේතු කොටගෙන මෙම යුගයේ ආරම්භ වූ විශිෂ්ඨ සාහිත්‍ය අංගය කුමක් ද?

(ලකුණු 04)



B

1. B රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. මොහු කුමන ජාතිකයෙක් ද?
3. පාප් වහන්සේගේ නියමය පරිදි දේශගවේෂණ ව්‍යාපාරයේ දී මොවුන්ට හිමිවූයේ කුමන ප්‍රදේශ ද?
4. මෙම පුද්ගලයා සොයාගත් ආසියාතික රට කුමක් ද?

(ලකුණු 04)

## II කොටස

(02) (i) ලංකා ඉතිහාසය හැදෑරීමට උපකාරී වන පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත A, B, C, D යටතේ සඳහන් වන තොරතුරු ලබාගත හැකි සෙල්ලිපි සඳහන් කරන්න.

A - වෙළඳපොලක පාලනය පිළිබඳව　　B - ආරාම පාලනය පිළිබඳව

C - වෙළඳ ශ්‍රේණි හා කර්මාන්ත පිළිබඳව　　D - I විජය බාහු රජුගේ ළමා කාලය පිළිබඳව

(ලකුණු 04)

(iii) ආර්යයන් ලක්දිව ජනාවාස පිහිටුවා ගැනීමේ දී අවධානය යොමු කළ කරුණු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) දේවානම් පියතිස්ස රාජ්‍ය සමය ලංකා ඉතිහාසය වෙනස් මඟකට යොමු කිරීමට හේතු විය. මෙය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) 13 වන සියවසේ සිට 15 සියවස දක්වා පැවති නිරිත දිග රාජධානි සමයේ ශාස්ත්‍රීය අංශයට ඉමහත් සේවයක් සිදු විය.

(i) පහත සඳහන් ශාස්ත්‍රීය ග්‍රන්ථ නිර්මාණය වුයේ කුමන රාජධානි සමයේ දැයි A, B, C අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A. දළදා සිරිත

B. සමන්ත කූට වර්ණනාව

C. බුදුගුණ අලංකාරය (ලකුනු 03)

(ii) ගම්පොළ නගරය රාජධානියක් ලෙස තෝරා ගැනීමට බලපෑ සාධක හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) නිරිත දිග රාජධානි සමයේ ආර්ථික රටාවේ සිදු වූ වෙනස් වීම කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) හයවන පරාක්‍රම බාහු රාජ්‍ය සමයේ සිදු වූ වැදගත් දේශපාලනික සිදුවීම් තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(04) (i) පහත සඳහන් වැව් හා ඇළ මාර්ග ඉදි කළ රජවරු නම් කරන්න.

A. අභය වැව

B. ඇළහැර ඇළ

C. මින්නේරිය වැව (ලකුණු 03)

(ii) පහත සඳහන් වන්නේ වැවක් සතු අංගයන්ගෙන් කිහිපයකි. ඒවායින් ඉටුවන කාර්යයන් වෙන වෙනම අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. සොරොව්ව

B. සළපනාව

C. බිසෝකොටුව

D. පිටවාන (ලකුණු 04)

(iii) රජරට වාරි සම්පාදන කටයුතුවල දී භූමියේ විෂමතාවය ප්‍රයෝජනයට ගත් ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ලක්දිව පැවති ජලාශ්‍රිත ශිෂ්ටාචාරය පිරිහීයාමට බලපෑ සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) පහතින් දක්වා ඇති වර්ෂවල සිදු වූ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ ලියා දක්වන්න.

i. ක්‍රි .ව. 1833

ii. ක්‍රි .ව. 1910

iii. ක්‍රි .ව. 1920 (ලකුණු 03)

(ii) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) යටත් විජිත යුගයේ දී ලංකාවේ සංස්කෘතික පුනරුදයක් ඇතිවීමට බලපෑ සාධක දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ වතු වගාව පුළුල්වීමට බලපෑ හේතු, කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වී ඇති මූලික අයිතිවාසිකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) වර්තමාන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතු බලතල දෙකක් සඳහන් කරන්න. ඒවා ක්‍රියාත්මක වන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ක්‍රි. ව. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විධායක ජනාධිපතිවරයෙකු සතු බලතල රාශියකි. එයින් බලතල තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(07) (i) ක්‍රි.පූ. 5, 6 වන සියවස්වල ඉන්දියාවේ පැවති ලක්ෂණ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A. ගම් කිහිපයක් එකතු වී බිහිවූ රාජ්‍යයේ නායකයා හැඳින්වූයේ කුමන නමකින් ද?

B. සමාජ සංවිධානයේ දී ප්‍රධාන සමාජ ඒකකය වූයේ කුමක් ද?

C. මුල් ආර්යයන්ගේ පාරිශුද්ධ වස්තුව වූයේ කුමක් ද? (ලකුණු 03)

(ii) අශෝක රජු බුදු දහම වෙනුවෙන් කරන ලද සේවාවන් හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) මෞර්ය යුගයේ පාලන තන්ත්‍රය සකස් වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ගුප්ත අධිරාජ්‍යය තුළ බිහි වූ ශ්‍රේෂ්ඨ පාලකයෙක් ලෙස සමුද්‍ර ගුප්ත රජු හැඳින්විය හැකි ය. මෙය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(08) වැඩවසම් යුගය පරිහානියට පත්ව නූතන යුගය උදාවීමත් සමඟ විවිධ ක්ෂේත්‍රවල සිදු වූ වෙනස්කම්වලට අනුරූපව දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ පෙරළිය ජාතික රාජ්‍ය බිහිවීමයි.

(i) යුරෝපයේ ප්‍රථමයෙන් ම බිහි වූ ජාතික රාජ්‍ය තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) දේශගවේෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා ජාතික රාජ්‍ය දැක්වූ අනුග්‍රහය පිළිබඳ කරුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) කුරුස යුද්ධවලින් පසු බිහි වූ නව රාජ්‍යයන් වෙළඳාමේ දියුණුව උදෙසා දක්වන ලද දායකත්වය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ජාතික රාජ්‍යවල දේශපාලන ලක්ෂණ කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) කාර්මික විප්ලවය ලෝකයේ විවිධ රටවල දේශපාලන ආර්ථික හා සාමාජීය ක්ෂේත්‍රවලට බලපෑමක් ඇති කළේ ය.

(i) එංගලන්තයේ ඇති වූ කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ යුරෝපයේ රටවල් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) කාර්මික විප්ලවයෙන් සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් හතරක් දක්වන්න. (ලකුණු 04)

(iii) එංගලන්තයේ දී ම කාර්මික විප්ලවය ආරම්භ වීමට තුඩුදුන් කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවය නිසා සිදු වූ සමාජ හා ආර්ථික වෙනස්කම් කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(10) (i) දෙවන ලෝක සංග්‍රාමයට ආසන්න සමයේ පහත සඳහන් ප්‍රදේශවලට ආක්‍රමණයන් එල්ල කළ රාජ්‍යයයන් අනුපිළිවෙලින් සඳහන් කරන්න.

A. මැන්චූරියාව

B. රයින්ලන්තය

C. ඉතියෝපියාව (ලකුණු 03)

(ii) පහත Q. R. S. T යටතේ දැක්වෙන එක් එක් කරුණට අදාළ පිළිතුර අනුපිළිවෙලින් ලියා දක්වන්න.

Q. පාප් තුමාගේ සිත දිනාගැනීම සඳහා මුසොලිනි පාප්තුමා සමඟ අත්සන් කරන ලද ගිවිසුම.

R. 1873 දී රුසියාව හා ඕස්ට්‍රියාව සමඟ බිස්මාර්ක් ඇති කරගත් සංගමය.

S. හිට්ලර් සිරභාරයේ සිටිය දී රචනා කරන ලද නාසිවාදයේ අත්පොත.

T. එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති නගරය. (ලකුණු 04)

(iii) පළමු වන ලෝක සංග්‍රාමයෙන් පසු සාමය ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ගත් ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වය ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)